# දැන්වීමයි

## සේවයට වාර්ථා කිරීම

උපකුලපතිතුමාගේ උපදෙස් පරිදි පහත කරුණු ඔබගේ අවධානය සඳහා යොමු කරන බව කාරුණිකව සලකන්න.

2021.10.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(V)ට අනුව රාජ්‍ය සේවය නව සාමාන්‍යකරණය යටතේ පවත්වාගෙන යාම සම්බන්ධයෙන්, සේවයට වාර්ථා කිරීමේදී පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

01. අදළ අංශ ප්‍රධානීන් විසින් එම අංශයේ සේවාවන් බිඳවැටීමකින් තොරව පවත්වා ගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන සේවක පිරිස් හඳුනාගෙන සේවයට කැඳවීමට කටයුතු කළ යුතුයි.

02. සේවයට කැඳවන නිලධාරීන් හැර අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ ස්වකීය රාජකාරියට අදළ කාර්යයන්හි යෙදීමට බැඳී ඇති අතර සේවයට කැඳවනු ලබන නිලධරයන් වුවද සේවයට නොකැඳවූ දිනයන්හී දී මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ රාජකාරි කළ යුතුය.

03. ආයතනය වෙත නිලධරයන් කැඳවීමේ දී ගර්භණී නිලධාරිනියන්, කිරිදෙන මව්වරුන් හා විශේෂ රෝගාබාධ වලින් පෙළෙන නිලධරයන් සේවයට නොකැඳවීමට කටයුතු කළ යුතු අතර එවැනි නිලධරයන් සේවයට කැඳවීම අත්‍යාවශ්‍ය අවස්ථාවල දී පමණක් සිදු කළ යුතු අතර එවැනි අවස්ථාවන්හී දී සේවයට පැමිණීමට හා පිටවීමට විශේෂ කාල සීමාවක් ලබා දීමටත් විශේෂ පහසුකම් ලබා දීමටත් කටයුතු කළ යුතුය.

04. නිලධරයන් සේවයට වාර්ථා කිරීම සම්බන්ධයෙන් පැමිණීමේ හා පිටවීමේ ලේඛනයක් පමණක් නඩත්තු කිරීම ප්‍රමාණවත් වේ. එසේ සිදු කිරීමේ දී උදය වරුවේ හෝ සවස් වරුවේ පැය භාගයක සහන කාලයක් ලබා දීමට උපකුලපතිතුමා උපදෙස් දි ඇත.

05. සියලුම සේවකයන් අනුමත සෞඛ්‍ය නීති රීති වලට අනුගතව කටයුතු කළ යුතු වේ.

ඉහත ප්‍රධාන කරුණු වලට අමතරව රාජ්‍ය සේවා පරිපාලන චක්‍රලේඛ 02/2021(V) ආකාරව ක්‍රියාකරන මෙන් දන්වා සිටිමි.

ඩබ්.එම්.ඩී.පී. මඩවල හුලුගල්ල
ලේඛකාධිකාරි
2021.10.04